**ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුව - 2025**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ(සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජුලි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මහා භාරකාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරිම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා දී තිබූ වාහන දෙකක් පිරිවැයට හෝ තක්සේරු කළ අගයට මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු වටිනාකම 2026 මාර්තු මස ගිණුම් සාරාංශයේ ආරම්භක ශේෂයන් ලෙස සටහන් කිරීමට මේ වන විට කටයුතු කර ඇත. | දෙපාර්තමේන්තුවට පැවරූ වාහනවල වටිනාකම් මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කළ යුතුය. |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1 (අ) | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා දී තිබූ වාහන 2ක් පිරිවැයට හෝ තක්සේරු කළ අගයට මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 1.6.1 (අ) |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 වියදම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | එක් පුනරාවර්තන වැය විෂයක් හා එක් මූලධන වැය විෂයක් සඳහා ප්‍රතිපාදිත රු. 7,500,000 ක් වූ සමස්ත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | එම වර්ෂයේ ප්‍රාග්ධනමය සංවර්ධනයක් සිදු නොකළ හෙයින් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වීමට හේතු වූ බව. | නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයන් 11ක් හා මූලධන වැය විෂයන් 2ක් සඳහා ප්‍රතිපාදිත රු.46,650,000 න් රු.13,432,598 ක් ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ත් සියයට 90 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | වෙනත් දීමනාවන් ඇතුළත් දීමනා මූලික වැටුපට එකතු කිරීම, අපේක්ෂිත විදේශ ගමන් සිදු නොවීම, ප්‍රාග්ධන වියදම් සිදු නොකිරීම නඩත්තුවට වෙන් කළ ප්‍රතිපාදන ඉතිරි විම, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීමේ වියදම් අපේක්ෂිත මට්ටමින් පැන නොනැගීම, වාහන අලුත්වැඩියා කිරීම් හා සවිකිරීම් අපේක්ෂිත මට්ටමින් සිදු නොවීම හා සේවා අවශ්‍යතාවයන් පරිදි අත්‍යවශ්‍යම පුහුණු වැඩසටහන් සඳහා පමණක් නිලධාරීන් යොමු කිරීම යන හේතු නිසා ඉතිරි වී ඇති බව. | නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ඇ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි සැප්තැම්බර් මාසයට අදාළ ණය ශේෂ අයකිරීමක් වෙනත් ශීර්ෂයකට බැරකිරීම හේතුවෙන් වර්ෂ අවසාන ශේෂයේ දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අතර රු.25,124 ක වෙනසක් පැවතුණි. | මේ වන විට මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර වෙනස නිරවුල් කරගත යුතුය. |
| (ඈ) | CIGAS වෙබ් යෙදවුම මඟින් ජනනය වන මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA 82) සමාලෝචිත වර්ෂය තුළ අනෙකුත් යන්ත්‍ර හා උපකරණ මිල දී ගැනීම් එකතුව රු. 8,556,677 ක් විය යුතු වුවත් රු.8,523,677 ක් ලෙස දක්වා තිබීමෙන් රු.33,000 ක වෙනසක් නිරූපණය වන අතර එම රු.33,000 ක වටිනාකම SA 82 ප්‍රකාශයේම ප්‍රවාහන උපකරණවල මිලදී ගැනීමක් ලෙස සටහන් කර තිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය නොවන වත්කම් වාර්තාව නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 3.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික විගණන පනතේ විධිවිධාන වලට අනුකූලව මෙම සහතික වීම ඉදිරිපත් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 4.2 ඡේදයෙහි සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි. | 2025 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතින බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.2.5,4.5,4.6 සහ 6.3 උප වගන්ති | 137,500 | විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අය විය යුතු වර්ෂ 3ක් ඉක්මවූ ණය මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | 2026 මාර්තු මස ගිණුම් සාරාංශය මඟින් ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ XXIV විධිවිධාන ප්‍රකාරව ණය අය කර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | | |
| | • 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර ඉන්ධන භාවිතයේ වෙනස්කම් හඳුනා ගැනීම සඳහා චක්‍රලේඛයෙහි දක්වා ඇති පරිදි මාසික ප්‍රවාහන සේවා සටහන සම්පූර්ණ කිරීමට ද කටයුතු කර නොතිබුණි. | වාහන වලට අදාළව ඉන්ධන පරීක්ෂාව කිරීමට කටයුතු කරනු ලැබේ. ඉන්ධන භාවිතයේ වෙනස්කම් හඳුනා ගැනීමට චක්‍රලේඛයෙහි දක්වා ඇති පරිදි මාසික ප්‍රවාහන සටහන විධිමත්ව සකසා ලබා දීමටත් කටයුතු කරන බව. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| • 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 3 ඡේදය | සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මුල් මාස 04 සඳහා ක්‍රියාකාරී සැලැස්ම පළමුව සකස් කරන ලද අතර 2025 අයවැය ඇස්තමේන්තුව සම්මත වූ පසු ඒ අනුව වගකිව යුතු නිලධාරීන් හා කාර්ය සාධන දර්ශකද ඇතුළත් කර නැවත ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| • 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 4 ඡේදය | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගෙන එහි පිටපතක් විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් 2025 වර්ෂයට අදාළව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අනුමැතිය ලබාගෙන නොමැති බව පිළිගන්නා අතර 2026 වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමත කරගෙන ඇති බව. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු බව. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතු වුවත් 2024 වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025 ඔක්තෝබර් 15 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. | 2025 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතින බව. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ සඳහන් කාලරාමුව තුල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

## 4.2 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු වාහනයකට 2007 ජනවාරි 27 දින සිදු වු අනතුර සම්බන්ධයෙන් වු රු.254,038 ක අලාභය, අදාළ රියදුරුගෙන් අයකර ගැනීම සඳහා අධිකරණයේ පවරා තිබූ නඩුව සම්බන්ධව පසු විපරම් සිදු නොකිරීම හේතුවෙන් කාලාවරෝධය මත නිෂ්ප්‍රභා වී තිබූ අතර අනතුර සිදුවී වර්ෂ 18 ක් ගත වුවද අදාළ පාඩුව වගකිවයුතු අයගෙන් අයකර ගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි. | අලාභය පොතෙන් කපා හැරීම සඳහා මු.රෙ.109 පරිදි ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරින්ගෙන් අය කළ යුතුය. |

## 4.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ සඳහන් වන භාර 1,144 ක් හා බූදල් 176 ක පරිපාලන කටයුතු සිදු කරනු ලබන බව දක්වා තිබුණද, දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන සියලුම භාර හා බූදල්වල බූදල් පැවරු දිනය, ඊට අදාළ වත්කම් හා බූදලයේ වටිනාකම් යනාදි තොරතුරු ඇතුළත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | භාර බූදල් ඇතුළත් ලේඛනයක් සකස් කර ඇති අතර එය යාවත්කාලීන කර පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. | දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන සියලු භාර හා බූදල් සම්බන්ධ තොරතුරු ලේඛනයට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්ථාපක විසින් භාර හා බුදල් අවසන් කරන අවස්ථා පවතින අතර, එසේ අවසන් කළ භාර හා බුදල් මොනවාද යන්න සහ අක්‍රීය භාර හා බුදල් පිළිබඳව 2025 දෙසැම්බර් 31 දින වනවිට දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලබන භාර හා බුදල්වල අක්‍රීය භාර හා ස්ථාපක විසින් අවසන් කර වසා දමා ඇති භාර පිළිබඳ යාවත්කාලීන තොරතුරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | භාර හා බුදල් ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගෙන ඇති බව. | අක්‍රීය හා කටයුතු අවසන් කළ භාර හා බුදල් පිළිබඳව තොරතුරු ලේඛනගත කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරනු ලබන භාර හා බුදල්වල පරිපාලන කටයුතු කිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රජයට ගෙවිය යුතු සියයට 4 ක් වූ මුලධන ගාස්තුව, ආදායම් ගාස්තුව හා නිශ්චල දේපළ මත ලැබෙන ආදායම් මගින් ගෙවිය යුතු සියයට 7ක රජයේ ගාස්තු නිසි පරිදි අයකර ගත යුතු වුවත් පරිපාලනය කරනු ලබන භාර හා බුදල් ප්‍රමාණය පිළිබඳ නිසි තොරතුරු නොමැති වීම නිසා ආදායම් ගාස්තු නිසි ලෙස ගෙවා ඇත්ද යන්න විගණනයට තහවුරු කර ගත නොහැකි විය. | භාර හා බුදල් වලින් ලැබිය යුතු ආදායම් ගාස්තු නිසි පරිදි අය කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව. | භාර හා බුදල්වලට අදාළ නිශ්චල දේපළ පිළිබඳ වාර්තා පවත්වා ගැනීම හා ආදායම් ගාස්තු නියමිත කාලය තුළ අය කර රජයට අදාළ ගාස්තු ගෙවීම සිදු කල යුතුය. |
| (ඈ) | ක්‍රියාකාරී සැලැස්ම අනුව 2025 දෙසැම්බර් 31 දින වන විට මහා භාරකාර දෙපාර්තමේන්තුව යටතේ පරිපාලනය කරනු ලබන භාර හා බුදල් 1,317 න් භාර හා බුදල් 401 කට අදාළව රු. මිලියන 311ක වියදමක් දරා තිබුණි. භාර හා බුදලයකට අයත් වියදමක් එම භාර හා බුදලයේ අරමුදලින් දැරිය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් අරමුදල් පවතින භාර හා බුදල් වලින් සියලු වියදම් දරා තිබුණි. එම තත්ත්වය හේතුවෙන් රුපියල් මිලියන 311 ක වියදම දරා ඇත්තේ කුමන භාර හා බුදල් වල අරමුදල් භාවිතා කිරීමෙන්ද යන තොරතුරු හඳුනාගත නොහැකි විය. | සෘණ මුදල් ශේෂ වාර්තා වන භාර හා බුදල් හඳුනාගෙන එම භාර හා බුදල් වල ආදායම වැඩිකිරීම, වියදම් අවම කිරීම හා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග තුළින් මෙම ගැටලුව විසඳා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අදාළ භාර හා බුදලයේ අරමුදලින් එම භාර හා බුදලයේ වියදම් පමණක් දැරිය යුතුය. |
| (ඉ) | සී. ඊ. වනිගසූරිය බුදලයට අයත් දේපළ විකුණා බුදල්කරුගේ නමින් භාරයක් පිහිටුවීම සඳහා මහා භාරකාරතැන වෙත 2005 වර්ෂයේදී අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණ ද ඇතැම් ඉඩම් කොටස් සහ ඊට ඇතුළත් ගොඩනැගිලිවල | ඉඩම් කොටස් හඳුනා ගැනීම සඳහා මේ වන විට කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව එම ඉඩම් හඳුනා ගැනීමට කටයුතු | මහාභාරකාර තැනට හිමි දේපළ ආරක්ෂා කිරීමට පියවර ගෙන භාරයේ අරමුණු ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හිමිකාරිත්වය හඳුනා ගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරු වන පරිදි ආරක්ෂා කිරීමටත්, එම දේපළ විකුණා බුදල්කරුගේ අරමුණු ඉටුකිරීමටත් කටයුතු කර නොතිබුණි. | කරමින් පවතින බව. | |
| (ඊ) | යැපෙන්නන් වෙත ගෙවීම සඳහා 2025 දෙසැම්බර් 31 දිනට විදේශ වන්දි ලෙස යැපෙන්නන් 272 කට රු.254,261,880ක් ගෙවිය යුතුව තිබුණි. මෙම වටිනාකම තුළ 1991 ට පෙර පැවති රු. 1,187,997 ක් සහ වර්ෂ 5 කට පෙර සිට පැවත එන යැපෙන්නන් 98 කට අදාළ රු.29,125,201 ක වටිනාකමක් පැවති අතර, එම වන්දි මුදල අදාළ වන්දි ලාභීන් හඳුනා ගෙන ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර වන්දි ගෙවීම් සම්බන්ධ තොරතුරු පවත්වා ගැනීම සඳහා පරිගණක පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි.<br><br>විදේශ වන්දි ගෙවීමට අදාළ වර්ෂ 05 කට වඩා වැඩි පැරණි ශේෂ සඳහා යැපෙන්නන්ගේ නම, ලිපිනය ආදී විස්තර ඇතුළත් විධිමත් ලේඛනයක් හා අවුරුදු 18 ට අඩු යැපෙන්නන්ගේ වන්දි මුදල් පිළිබඳ ලේඛනයක් නඩත්තු කිරීමද සිදුකර නොතිබුණි. | මේ දක්වා හිමිකම් නොපාන ලද ගෙවීම් සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ, කොන්සියුලර් අංශය හා සම්බන්ධ වී කටයුතු කරන බවත් 2002 වර්ෂයට පසු වන්දි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යන බව. | වන්දි මුදල් ලද විගස ගෙවා අවසන් කළ යුතුය. |
| (උ) | වර්ෂ 20 කට වැඩි කාලයක සිට පැවත එන විහාරස්ථාන 280 කට අදාළව විහාර වන්දි ලෙස ගෙවිය යුතු රු.39,641,651 ක වටිනාකමක් පැවති අතර 2025 දෙසැම්බර් 31 දින වන විට ද අදාළ විහාරස්ථාන වෙත එම මුදල් නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ පවතින විහාර වන්දි පිළිබඳ විහාරස්ථාන දැනුවත් කිරීමට ලිපි යොමු කර ඇති බව. | වන්දි මුදල් අදාළ විහාරස්ථාන වෙත ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 1968 අගෝස්තු 11 දින සිංගප්පූරුවේදී මියගිය ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මියගේ ශ්‍රී ලංකාවේ පැවති නිශ්චල හා චංචල දේපළ විකුණා ලැබෙන මුදල් උරුමකරුවන්ට / අර්ථලාභීන්ට ලබා දීම සඳහා ඇටර්නි බලකරු ලෙස මහා භාරකාරවරයා පත්කර තිබූ අතර දේපල විකිණීමෙන් ලද රු. 64,645,776 ක මුදල උරුමකරුවන් / අර්ථලාභීන් වෙත ලබා දීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | උරුමකරුවන් 30 දෙනෙක් වෙත ගෙවීම් කර ඇත. ඉතිරි 16 දෙනා ඉදිරිපත් වී නොමැත. මෙම අර්ථලාභීන්ගෙන් බහුතරය විදේශගත වී සිටින නිසා අර්ථලාභීන් සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ඉදිරි කටයුතු ප්‍රමාද වෙමින් පවතින බව. | දේපළ විකුණා ලද මුදල් අර්ථලාභීන්ට ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | මහා භාරකාර දෙපාර්තමේන්තුවේ ආඥා පනතේ 47 (1) වගන්තියට අනුව මහා භාරකාරවරයාගේ ගිණුම් අමාත්‍යවරයා විසින් නියම කරන ඕනෑම අවස්ථාවක එසේ නියම කරන ආකාරයට නියමිත තැනැත්තෙකු විසින් යටත් පිරිසෙයින් වාර්ෂිකව එක් වරක් හෝ විගණනයක් සිදු කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. | මහා භාරකාර ආඥා පනතට අනුව විගණනය සඳහා මහාභාරකාර දෙපාර්තමේන්තුවේ යෝජනා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බව. | මහා භාරකාර ආඥා පනත අනුව භාර ගිණුම් විගණනය කළ යුතුය. |
| (ඒ) | එච්.ඒ. ද සිල්වා භාරයට අයත් හොරණ තෝප් වත්ත ඉඩම මාග ඉංජිනියර්ස් (පුද්ගලික) සමාගම වෙත 2021 සැප්තැම්බර් 01 දින සිට 2025 අගෝස්තු 31 දින තෙක් බදු ගිවිසුමක් මත ලබා දී තිබූ අතර 2025 අගෝස්තු 31 දිනෙන් බදු ගිවිසුම අවසන් වී ඇති නමුත් 2025 සැප්තැම්බර් මස සිට මේ දක්වා පෙර ගිවිසුමේ සඳහන් කුලිය පදනම් කර ගෙන අය කිරීම් සිදුකර තිබුණද විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබුණි. | නව තක්සේරු වාර්තාව ලැබුනු පසු කඩිනමින් නව ගිවිසුමක් අත්සන් කර එම බදු ගිවිසුමේ පිටපතක් ලබා දීමට කටයුතු කරන බව. | ඉඩම් බදු දීමේදී නීත්‍යානුකූල ගිවිසුමක් මත බදු දිය යුතුය. |
| (ඔ) | එන්.ඩී.එස් සිල්වා බූදලයට අයත් කලුතර පලාතොට පිහිටි පෞරාණික වටිනාකමකින් යුතු රිච්මන්ඩ් කාසල් මන්දිරය නිසි කාලය තුළ අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් වහලයෙන් ජලය කාන්දු වී බිත්ති වලට හානි වී තිබීම හේතුවෙන් පහලමාලය පමණක් සංචාරකයන් සඳහා නැරඹීමට විවෘතව තබා ඇති අතර එය 2025 වර්ෂයේ දේශීය විදේශීය සංචාරකයන් මන්දිරය නැරඹීමෙන් රු 9,754,725ක ටිකට්පත් ආදායමක් ලබා තිබුණද මන්දිරය අලුත්වැඩියාව සඳහා අවදානය යොමු කර නොතිබුණි. | සංරක්ෂණය සහ අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය උපදේශන හා වැඩ ප්‍රසම්පාදන කටයුතු මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සිදුවෙමින් පවතින බව. | රිච්මන්ඩ් කාසල් මන්දිරය කඩිනමින් අලුත්වැඩියා කර බූදල්කරුගේ අරමුණු ඉටු කළ යුතුය. |
| (ඕ) | හැරී හපුගොඩ බූදලය | | |
| | (i) හැරී හපුගොඩ බූදලයේ සුදුවැලිපොත වත්ත බදු දීම සඳහා ඉඩම් කොටස් තීරණය කිරීමේදී කිසිදු ආදායමක් නොලබන කුඹුරු ඉඩම් අක්කර 48ක භූමි ප්‍රමාණය බදු දීම සඳහා සලකා බලා නොතිබුණි. අක්කර 113ක් අතුරින් අක්කර 61 පර්චස් 33ක භූමි ප්‍රමාණයක් පමණක් තෝරා ගෙන තිබූ අතර එහි සාරවත් වගාවන් සහිත බිම් කොටස් ද බදු දීම සඳහා තීරණය කර තිබුණි. | අලුත් වගාවක් ඇති කිරීමට බාධාවක් පවතින බව හා යම් මට්ටමකට නිරවුල් ව පවතින ඉඩම් ප්‍රමාණය බදු දී නිශ්චිත ආදායම් මාර්ගයක් සපයා ගැනීමට කටයුතු කරන බව. | පුරන්ව පවතින ඉඩම් කොටස් බදු දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (II)ලාවළුගහදූව සහ යගල්කන්ද ඉඩම් කොටස් අක්කර 24 ක් පමණ වන අතර මායිම් කණු සලකුණු කර දෙපාර්තමේන්තු නාමය ප්‍රදර්ශනය කර ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නාමපුවරු සවිකිරීමට වතු අධිකාරීවරයාට උපදෙස් ලබාදී ඇති බව. | ඉඩම්වල මායිම් සලකුණු කර දෙපාර්තමේන්තු නාම පුවරු සවි කර ඉඩම් ආරක්ෂා කර ගත යුතුය. |
| | (III) බූදලයට අයත් බංගලාව පිහිටි ඉඩම් කොටස අක්කර 04 රූඩ් 01 පර්චස් 08 ක වපසරියකින් යුතු වුවත් මැණුම් කටයුතු සිදුකර නොමැති බැවින් අදාළ ඉඩම් ප්‍රමාණයම දෙපාර්තමේන්තුව භුක්ති විදින්නේ ද යන්න සොයාගත නොහැකි වූ අතර හැරි හපුගොඩ බූදල්කරු ජීවත්ව සිටි නිවස ද මෙම ඉඩමේ පිහිටා ඇත. වර්තමාන වතු අධිකාරි තම රාජකාරි කටයුතු සඳහා හා පදිංචිය සඳහා මෙම නිවස භාවිතා කරන අතර නිවස ඉතා අබලන් තත්වයේ පැවතියද අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුමේ පවතින හර ශේෂය නිසා අලුත්වැඩියා කටයුතු අත පසුවී ඇති බව. | ගොඩනැගිලි නිසි කාලය තුළ අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| | (iv)හැරී හපුගොඩ බූදලයට අයත් අක්කර 17 රූඩ් 2 පර්චස් 1.5 කින් යුතු මත්තක වත්ත බදු පදනම මත ලබා දීමට එකග වූ බව 2025 දෙසැම්බර් 16 දින බදුගැණුම්කරු වෙත ලිඛිතව දන්වා තිබුණද රුපියල් 5,560,000 ක මූලික තැන්පතුවක් ලබා ගැනීම හැර බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | ගිවිසුම ලියාපදිංචිය සඳහා යොමු කිරීමට කටයුතු කරන බව. | ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ක) | දොන් සයිමන් විජේවික්‍රම මහතා විසින් 1950 වර්ෂයේදී ලියන ලද අන්තිම කැමති පත්‍රය මඟින් ඩී.එස්. ඩබ්ලිව්. සමරකෝන් පුණ්‍ය භාරය පිහිටුවා ඇති අතර, එහි අරමුණු වන පිළියන්දල නගරයේ ඉදිකිරීමට යෝජිත රෝහලෙහි වාට්ටුවක් ඉදිකිරීමටත්, එය ඔහුගේ නැසීගිය මවගේ නමින් නම් කිරීමටත් මහා භාරකාර තැන වෙත පවරා තිබුණි. මේ වන විටත් එම රෝහලෙහි වාට්ටුව ඉදිකිරීමට කටයුතු කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද මූලික අරමුණින් පරිබාහිරව වෙනත් භාණ්ඩ (වෛද්‍ය නොවන උපකරණ) පරිත්‍යාග කිරීමක් පමණක් සිදු කර තිබුණි. | පිළියන්දල රෝහලෙහි සැරහුම් ඒකකය නවීකරණය හා ඊට අදාළ පිඹුරුපත් සහ ප්‍රමාණ පත්‍ර සකස් කර එවන ලෙස දන්වා ඇති අතර, අදාළ ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලබන බවටත් 2024 දී හා 2025 දී ලිපි මඟින් වැඩිදුරටත් විමසීම් කර ඇති බව. | බූදල්කරුගේ අරමුණු ඉටු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 77 වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 66 වූයෙන් තනතුරු 11 ක් පුරප්පාඩු වී පැවතුනි. | දැනට ගණකාධිකාරී තනතුර සඳහා වැඩ බැලීම සඳහා පත් කර ඇති අතර නීති නිලධාරියෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලැබේ. ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලිඛිතව ඉල්ලීම් කර ඇති බව. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතුය. |
| (ආ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 5 ක් එකම සේවා ස්ථානයෙ හි සේවය කර ඇති නිලධාරියෙකු වෙනත් සේවා ස්ථානයක් සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව තුල වර්ෂ 5 ඉක්ම වූ නිලධාරීන් සඳහා ස්ථාන මාරු වීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | 2026 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහාද 2025 ජූලි මස ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේ දී 2025 ජුනි 30 දිනට දෙපාර්තමේන්තුවේ වර්ෂ 05 කට වැඩි නිලධාරීන් 14 දෙනෙකු පිළිබද තොරතුරු නිර්දේශ කර යවා ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව ස්ථානමාරුවීම් ලබා දිය යුතුය. |